මගේ අංකය :- අධිසේකොස/කඩඉම්(පැරණි)/2021

සියලුම,
මහාධිකරණ විනිසුරුවරුන්,
දිසා විනිසුරුවරුන්/මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්/ අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත.

**උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවාවේ අධිකරණ ලිපිකාර සේවයේ II වන ශ්‍රේණියේ නිලධරයන් සඳහා වූ දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020 (පැරණි ව්‍යවස්ථාව අනුව)**

අංක 224/15 හා 1982 දෙසැම්බර් මස 23 දින දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද උපලේඛනගත රජයේ නිලධරයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ II වන කොටසේ 08 වන වගන්තියේ (I) (ඒ) සහ (ඔ) යන උපවගන්තියට අනුකූලව "එ" පරිශිෂ්ඨයෙහි II වන කොටසේ දැක්වෙන රෙගුලාසි, නිර්දේශ පත්‍රය සහ අවසන් වරට අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද සංශෝධන අනුව ඉහත සඳහන් විභාගය කොළඹ දී පැවැත්වීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

- ❖ උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ ලිපිකාර සේවයේ I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වීමෙන් හෝ නිදහස් කිරීම මගින් හෝ ඒ දෙකම මගින් සම්පූර්ණ කරන ලද අධිකරණ ලිපිකාර සේවයේ II වන ශ්‍රේණියේ නිලධරයන් පමණක් මේ විභාගය සඳහා පෙනී සිටීමට සුදුස්සෝ වෙති.

02. විභාග පටිපාටිය: විභාගය සඳහා පහත සඳහන් විෂයන් නියම කර ඇත. එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා කාලය පැය දෙකකි. සිංහල හා දෙමළ මාධ්‍යයෙන් විභාගය පැවැත්වේ.

02. 01. විභාගයේ විෂයයන්

(අ) භාෂාව (ඉංග්‍රීසි)

(ආ) අපරාධ හා සිවිල් නඩු කාර්ය පටිපාටිය

(ඇ) මුදල් රෙගුලාසි

02.02. නිර්දේශ පත්‍රය

(I) **භාෂාව (ඉංග්‍රීසි)** (කරුණාකර 04 වැනි ඡේදය බලන්න)

සාහිත්‍යමය හෝ පොදු විෂයක් පිළිබඳ වූ වාක්‍ය රචනයක්, සාරාංශ ලිවීම සහ අවබෝධය පිළිබඳ පරීක්ෂණ, වාග් මාලාව පිළිබඳ ප්‍රශ්න, වාග් සම්ප්‍රදාය සහ එහි භාවිතය හා වැරදි නිවැරදි කිරීම් ආදිය. මෙම ප්‍රශ්න පත්‍රය අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ තත්වයට සමාන වනු ඇත.

(II) **අපරාධ හා සිවිල් නඩු කාර්ය පටිපාටිය**

අපරාධ නඩු විධාන සංග්‍රහය සහ සිවිල් නඩු විධාන සංග්‍රහය පිළිබඳ සාමාන්‍ය දැනීමක් ලබා තිබීම අපේක්ෂිතයන්ගෙන් බලාපොරොත්තු වේ.

(III) **මුදල් රෙගුලාසි**

රජයේ මුදල් රෙගුලාසි වල 1 වන කොටස

03. මෙම විභාගයට අදාල විෂයකට පෙනී සිටීමේ අවශ්‍යතාවයෙන් නිදහස් වීමට අදාල ව්‍යවස්ථා සංග්‍රහයේ "එ" පරිශිෂ්ඨයේ II වන කොටසෙහි සඳහන් පරිදි කිසියම් නිලධරයෙකු සුදුසුකම් ලබා ඇත්නම්, ඒ සඳහා අදාල සහතික පත්‍රවල සහතික කරන ලද පිටපත් සමඟ ඔවුන්ගේ ඉල්ලීම් ඉදිරිපත් කර නිදහස් කර ගත යුතුවේ.

- නීතිඥවරුන් ලෙස ඇතුළත් කර ගැනීම සඳහා පවත්වනු ලබන අවසාන විභාගයේදී හෝ නීති උපාධි පරීක්ෂණයේදී හෝ අපරාධ හා සිවිල් නඩු කාර්ය පරිපාටිය විෂයයෙන් සාමාර්ථයක් ලැබූ නිලධරයෙකු (ආ) අපරාධ හා සිවිල් නඩු කාර්ය පරිපාටිය විෂයයෙන් නිදහස් කෙරෙනු ඇත.

04. සිංහල හෝ දෙමළ මාධ්‍යයෙන් සේවයට බඳවා ගනු ලැබූ නිලධරයෙකු ඉංග්‍රීසි භාෂාව ප්‍රශ්න පත්‍රයට පෙනී සිටිය යුතුය.

05. පහත 6 ඡේදයේ සඳහන් කොන්දේසිවලට යටත්ව අයදුම්කරුවන්ගේ අභිමතය පරිදි මෙම විභාගයේ විෂයයන් සඳහා එකම වරකදී හෝ වෙන් වෙන් වාර වලදී පෙනී සිටිය හැක. එතෙකුදු වුවත් සාමාර්ථයක් සඳහා එක් එක් විෂය සඳහා වූ ලකුණු වලින් අවම වශයෙන් 40% ක් ලබා ගත යුතුය.

06. පළමුවන වරට මෙම විභාගයට පෙනී සිටින නිලධරයන් විසින් විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතකුදු වුවත් ඉන්පසු වාරවලදී අයදුම්කරුවන් විසින් එකවරකදී සම්පූර්ණ විභාගයට පෙනී සිටින්නේ නම් හෝ එක් විෂයයකට වඩා පෙනී සිටින්නේ නම් රු 500/- ක් ද එක් විෂයයක් සඳහා පෙනී සිටින්නේ නම් රු 250/- ක් ද විභාග ගාස්තු වශයෙන් අය කරනු ලැබේ. (සටහන බලන්න) තවද, මීට ප්‍රථම මෙම විභාගයට අයදුම්කර ඒ සඳහා ඉදිරිපත් නොවූ නිලධරයන්ද, කිසියම් හේතුවක් නිසා අයදුම්පත් ප්‍රතික්ෂේප කරන ලද නිලධරයන්ද දෙවන වතාවට ඉදිරිපත් වන සේ සලකා විභාග ගාස්තු ගෙවා විභාගයට අයදුම් කළ යුතුය.

07. මෙම විභාග ගාස්තු ''**අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්** ''නමින් මහජන බැංකුව, වෙල්ල වීදිය ශාඛාවේ පවත්වාගෙන යන ගිණුම් අංක **297100199025039** ට බැර කර ලබා ගන්නා ලදුපත අයදුම් පත්‍රයේ අලවා එවිය යුතුය.

08. මේ සමඟ ඇති ආකෘති පත්‍රයට අනුව 11 ½ " X 8 ½ " ප්‍රමාණයේ ඝන කඩදාසියේ සකස් කොට සම්පූර්ණ කරන ලද අදාල නිලධරයන්ගේ අයදුම්පත්‍ර ඔබේ නිර්දේශය සමඟ **2023 ජනවාරි මස 31** වන දිනට හෝ එදිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් මෙම කාර්යාලයට එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **" අධිකරණ ලිපිකාර සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020 (පැරණි ව්‍යවස්ථාව අනුව) "** යනුවෙන් සඳහන් කළ යුතුය.

09. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර හා නිසි අයුරින් සම්පූර්ණ නොකළ අයදුම්පත්‍ර ද, කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර, ඒ සමඟ එවා ඇති විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

10. මෙම ලිපිය ඔබ අධිකරණයේ සියලු නිලධාරීන්ට දැන්වීමට කටයුතු කරන්න.

**සටහන :- 2018.09.11 දිනැති උපලේඛනගත රජයේ නිලධරයන්ගේ ව්‍යවස්ථා සංග්‍රහයේ 15.3.2 හා 15.3.3 වගන්ති පහත පරිදි වේ.**

**15.3.2 "මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීමට පෙර පැවති සේවා ව්‍යවස්ථාව යටතේ අධිකරණ ලිපිකරු, අධිකරණ භාෂණ පරිවර්තක, අධිකරණ ලඝු ලේඛක සහ අධිකරණ යතුරු ලේඛක සේවාවල II ශ්‍රේණියට අදාල වන පළමු වන හා දෙවන වන කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්පූර්ණ කරන ලද නිලධරයන් මෙම සේවා ව්‍යවස්ථාව යටතේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ (අධිකරණ ලිපිකරු, අධිකරණ භාෂණ පරිවර්තක, අධිකරණ ලඝු ලේඛක සහ අධිකරණ යතුරු ලේඛක සේවාවන්ට අයත්) II ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්/නිදහස් වුවා ලෙස සැලකේ."**

15.3.3 "නියමිත දිනට පළමුවන හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්පූර්ණ නොකරන ලද අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ (අධිකරණ ලිපිකරු, අධිකරණ භාෂණ පරිවර්තක, අධිකරණ ලඝු ලේඛක සහ අධිකරණ යතුරු ලේඛක) II වන ශ්‍රේණියේ නිලධරයන්ට පැරණි ව්‍යවස්ථාව යටතේ කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට පෙනී සිටීම සඳහා නියමිත දින සිට වසර තුනක සහන කාලයක් ලබා දෙනු ලැබේ. එම කාලය තුළ අදාල පළමු වන හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාග දෙක සමත් වී/නිදහස් වී සම්පූර්ණ කර ගැනීමට අපොහොසත් වන නිලධරයන් එක් කාර්යක්ෂමතා කඩඉම් විභාගයක් හෝ එකී විභාගවල එක් විෂයක් හෝ විෂයයන් කීපයක් සමත් වී තිබුණද, මෙම ව්‍යවස්ථාව යටතේ අධිකරණ කළමනාකරණ සේවයේ (අධිකරණ ලිපිකරු, අධිකරණ භාෂණ පරිවර්තක, අධිකරණ ලඝු ලේඛක සහ අධිකරණ යතුරු ලේඛක) II වන ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුය."

සැ.යු - ඉහත ප්‍රතිපාදන අනුව අධිකරණ ලිපිකරු II වන ශ්‍රේණියේ නිලධරයන් සඳහා පැරණි සේවා ව්‍යවස්ථාව යටතේ පෙනී සිටීමට ලබාදුන් වසර තුනක සහන කාලය තුළ පවත්වනු ලබන මෙම විභාගය, ඒ යටතේ පවත්වනු ලබන 3 වන (අවසන්) විභාගය බව මෙයින් දන්වනු ලැබේ.

පී.එම්.ටී.බණ්ඩාර
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්

පී.එම්.ටී. බණ්ඩාර
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12.

අත් කලේ : එච්.එස්.සෝමරත්න
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්

2023 ජනවාරි මස 11 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදී ය.

# SPECIMEN APPLICATION FORM

## Second Efficiency Bar Examination for Officers in Grade II of the Court Clerical Service of Sri Lanka - 2020

## (According to the old S.P.O's Service Minute)

01. Name:

    1:1 Name with initials Mr./Mrs./Miss:..................................................................................
    (In block capital letters)

    1:2 Full Name: ..................................................................................................................
    (In block capital letters)

    1:3 Full Name:...................................................................................................................
    (In Sinhala/Tamil)

    1:4 National Identity Card Number:.................................................................................

02. Permanent Address:..................................................................................................................
    (In block capital letters)

    2:1 Permanent Address:.........................................................................................................
    (In Sinhala/Tamil)

    2:2 Official Address:..............................................................................................................
    (In block capital letters)

    2:3 Official Address:..............................................................................................................
    (In Sinhala/Tamil)

03. Contact Details

    3.1 Mobile No-: ...................................................

04. Date of Birth: Date ___ Month ___ Year______

05. Personal File No: EA/PF/1/______

06. Medium in which you sit for the examination:

    ☐

    (Denote with " S " for Sinhala, " T " for Tamil)

07. Please give details of the subjects and the years you sat for the exam previously:

| Year | Subject |
|---|---|
| | I.<br>II.<br>III. |
| | I.<br>II.<br>III. |

08. Subject / Subjects you are now offering to sit for:

    (i) ...............................................
    (ii) ...............................................
    (iii) ...............................................

09. The value of payment made as examination fee:............................

| Affix the receipt here. |
|---|

I state that the particulars given are accurate and I am entitled to sit for the examination in the medium mentioned in the paragraph 6 above. I certify that I am appearing for the examination for the first time / I have annexed the receipt obtained after making the appropriate payment. I agree to abide by the rules governing the examination.

............................ ......................................................

Date Signature of the applicant

---

**Attestation**

I hereby certify that Mr./Mrs./Miss.....................................................................................................................
...............................................who is a Grade II Court Clerk is personally known to me and signed before me on ..................................................

..................................................

Signature of the Registrar

Date:....................................................

Name:....................................................

Designation:........................................

Address:...............................................

---

**Certificate of the Head of the Department**

I certify that,

01. The particulars furnished above were checked and found to be accurate.
02. The officer sits for this examination for the first time / has made the correct payment as examination fee.
03. The applicant is eligible to sit for this examination.

Designation:.....................................

Date..................................................

..........................................................................

Signature of the Head of the Department